ශීර්ෂය - 112 විදේශ කටයුතු අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව විදේශ කටයුතු අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව විදේශ කටයුතු අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා

සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**7002-0-0-35-13 දරන අග්‍රිම ගිණුම**		
(i)	දූත මණ්ඩල විසින් ලබා ගත් භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති එකතුව රු. 15,389,115 ක ආරක්ෂිත තැන්පතු මුදල්, වර්ෂ 10 කට වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි. මෙම වටිනාකම තුළ වසා දමන ලද ෆ්‍රැන්ක්ෆර්ට් (Frankfurt) දූත මණ්ඩලයට අදාළ 2007, 2011 සහ 2013 වර්ෂවල දී තබන ලද එකතුව රු.2,234,933 ක තැන්පතු මුදල් ද පැවතුණි.	ආරක්ෂිත ඇප තැන්පතු අයකර ගැනීමට නොහැකි වූ අවස්ථාවල ඒ සඳහා කිසියම් නිලධාරියෙකු සෘජුව වගකිව යුතු නම්, අදාළ නිලධාරියාගේ සේවා ස්ථාන මාරුවීමක දී ගෙවන ගමන් වියදම් දීමනාවෙන් අදාළ මුදල අයකර ගැනීමටත් විශ්‍රාම යාමක දී රජයට ඇති බැඳීමක් ලෙස එම නිලධාරියාගේ නොඉල්ලුම් සහතිකයේ සටහන් කිරීමටත් ක්‍රියා කර ඇත. නමුත් වසා දමන ලද ෆ්‍රැන්ක්ෆර්ට් කොන්සල් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව නියමිත කාලයට පෙර අදාළ ගිවිසුමෙන් ඉවත්වීම හේතුවෙන්, ආරක්ෂිත තැන්පතුව නැවත ලබාගැනීමට නොහැකි වී ඇත.	භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	මු.රෙ. 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිමය අදාළ කාර්යය නිම කළ වහාම පියවිය යුතු වුවත්, අවස්ථා 26 ක දී ලබාදී තිබුණු රු.10,415,296 ක් වර්ෂ 10 කට වැඩි කාලයක සිට නිරවුල් නොකර පැවතුණි.	2012 වර්ෂයේදී, ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ඉහළ නැංවීමේ අරමුණින් වොෂින්ටන් හි පැවැත්වූ ප්‍රවර්ධන වැඩසටහනෙහි සමාරම්භක උත්සවය වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ලබා දෙන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත අවශ්‍ය වූ ඉතිරි මුදල ජනාධිපති ලේකම් කාර්යාලය මගින් අතිරේක ප්‍රතිපාදනයක් ලෙස ලබා ගෙන පසුව පියවීමේ අපේක්ෂාවෙන් එකී ඉතිරි	වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන තත්කාර්ය අතුරු අග්‍රිමය නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

		මුදල අත්තිකාරම් ලෙස ගෙවීමට කටයුතු කරන ලදී. එහෙත්, ඒ සම්බන්ධයෙන් ජනාධිපති කාර්යාලයෙන් කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප වී තිබුණි.	

(ආ) **7002-0-0-35-24 අග්‍රිම ගිණුම**

(i)	2024 දෙසැම්බර් 31 දිනට රු.1,399,843,516 ක් වන අග්‍රිම ගිණුම් ශේෂය තුළ නොපියවූ අග්‍රිම ශේෂය රු.954,931,151 ක් වූ අතර ඉන් රු.95,418,299 ක් මාර්ගස්ථ මුදල් වන අතර රු.859,512,852 ක් විදේශ දූත මණ්ඩල මුදල් ශේෂයන් විය. නමුත් ගිණුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව මෙම මුදල් ශේෂයන් තුළ සිඩ්නි, ට්‍රිපෝලි හා අබුජා යන වසා දමන ලද විදේශ දූත මණ්ඩල තුනකට අදාළ එකතු වටිනාකම රු.13,996,985 ක මුදල් ශේෂයන් පැවති අතර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව වාර්තාවට අනුව ට්‍රිපෝලි දූත මණ්ඩලයට මුදල් ශේෂයක් දක්වා නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ නොපියවූ අග්‍රිම ශේෂය දැක්වෙන උපලේඛනයට 2011 වර්ෂයේ දී වසා දමන ලද ට්‍රිපොලි දූත මණ්ඩලයේ බැංකු ගිණුමේ ශේෂය ඇතුළත් කර නොතිබීමට හේතුව එම දූත මණ්ඩලයේ නිල බැංකු ගිණුමට අදාළ 2011 පෙබරවාරි 28 දිනැති බැංකු ප්‍රකාශයට අනුව පැවති ශේෂය පමණක් අමාත්‍යාංශය සතු වීමත් එදිනට මුදල් පොතේ පැවති ශේෂය පිළිබඳ කිසිඳු තොරතුරක් අමාත්‍යාංශය සතුව නොවීමත්ය. කෙසේ නමුත්, අදාළ බැංකු ශේෂය වන රු.3,066,628 (ඇමරිකානු ඩොලර් 27,156) මුදල අදාළ උපලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.	වසා දමන ලද විදේශ දූත මණ්ඩලවලට අදාළ බැංකු ගිණුම් පියවීමට කටයුතු කළ යුතුය.
(ii)	විදේශ දූත මණ්ඩලවලට අදාළ 2024 දෙසැම්බර් 31 දිනට රු.420,752,603 ක් වන නොපියවූ උප අග්‍රිම ශේෂයෙන් රු.57,905,530 ක් දූත මණ්ඩල කාර්යය මණ්ඩලය පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු ආරක්ෂිත තැන්පතු 131 ක් සඳහා විය. මෙම රු.57,905,530 ක ආරක්ෂිත තැන්පතු වටිනාකමින් වර්ෂ 5ට වඩා අඩු රු.11,108,252ක් ද වර්ෂ 5-20 අතර රු.44,408,759 ක් ද වර්ෂ 20ට වැඩි රු.2,388,516 ක් ද වූ අතර එම තැන්පතු නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	විදේශ දූත මණ්ඩල සඳහා පත්වීම් ලබන නව නිලධාරීන් වෙනුවෙන් නව නිවාස ලබා ගැනීමේදී මාසික කුලිය ඉතා ඉහළ අගයක් ගන්නා බැවින්, බොහෝවිට අදාළ නිලධාරියාගේ පූර්වගාමියා විසින් භාවිත කළ නිවස ම නව නිලධාරියා ද භාවිතා කිරීමට ගිවිසුම් ගත වේ. එම ක්‍රමය අනුගමනය කිරීම මූල්‍යමය වශයෙන් ශ්‍රී ලංකා රජයට වඩා වාසිදායක වේ. දීර්ඝ කාලයක් නිලධාරීන් කිහිප දෙනකු විසින් එකම නිවස භාවිතා කිරීම හේතුවෙන් එකී නිවසේ ඇති වන විවිධ නඩත්තුමය ගැටළු මත අදාල නිවෙස් හිමියා විසින් තැන්පතුව ආපසු ගෙවනු නොලැබේ. අදාළ පාඩු සඳහා සත්‍ය වශයෙන්ම වගකිවයුත්තේ කුමන නිලධාරියා දැයි නිශ්චිතව හඳුනා ගත	තොරතුරු සඳහා නිසි වාර්තාකරණයක් පවත්වාගනිමින් වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමටත් නොපියවූ තැන්පතු නිරවුල් කිරීමටත් ක්‍රියා කළ යුතුය.

		නොහැකිවීම නිසා වගකිවයුතු නිලධාරියාගෙන් අයකර ගැනීම ද දුෂ්කර වී ඇත. වර්ෂ 10කට පමණ පෙර ගෙවූ මෙම අත්තිකරම් ගෙවා ඇත්තේ කුමන නිලධාරින් වෙනුවෙන් ද යන්න සෙවීම ද ඉතා දුෂ්කර නමුත්, මේ සම්බන්ධයෙන් තවදුරටත් තොරතුරු සොයා බලා කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දුනි.	
(iii)	2022 වර්ෂයේ දී වසා දමන ලද සිඩ්නි, ෆැන්ක්ෆර්ට් හා සයිප්‍රස් යන දූත මණ්ඩල තුනට අදාළ නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු රු.9,139,919 ක් නිරවුල් කර නොතිබුණි.	කුලී ගිවිසුම් කල් පිරීමට පෙර ඉවත්වීම මත තැන්පතු අය කර ගැනීමේ ගැටළු මතුවී ඇත. එහෙත් දැනට මෙම දූත මණ්ඩලවල කටයුතු ආවරණය කිරීමට පවරා ඇති දූත මණ්ඩල මාර්ගයෙන් අදාල මුදල් නැවත ලබා ගැනීමට උත්සාහ කරමින් පවතී.	තැන්පතු නිරවුල් කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.
(iv)	මු.රෙ. 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිම කළ වහාම පියවිය යුතු නමුත් 2024 දෙසැම්බර් 31 දිනට දූත මණ්ඩලවල නොපියවූ තත්කාර්යය අතුරු අග්‍රිම රු.4,373,096ක් පැවතුණි. මෙහි වර්ෂ 5 ට අඩු රු.2,151,104 ක් ද වර්ෂ 5-10ත් අතර රු.1,802,265ක් ද වර්ෂ 10 ඉක්මවූ රු.419,727 ක් ද පැවතුණි.	මෙම අතුරු අග්‍රිම අතරින් බොහොමයක් අදාළ කාර්යය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් අග්‍රිම ලෙස ගිණුම්ගත කර ඇත.	තත්කාර්ය අතුරු අග්‍රිම නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කළ යුතු වුවද**,** පුනරාවර්තන වැය විෂයන් 08 ක රු.751,301,915 ක හා මූලධන වැය විෂයන් 07ක රු.355,140,953 ක ප්‍රතිපාදන සියයට 54 ක සිට සියයට 100 ක් දක්වා පරාසයකින් උපයෝජනය කර නොතිබුණි.	ඇස්තමේන්තු සකස් කිරීම මු.රෙ. 50(ii) ප්‍රකාරව සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කර ඇතත් ප්‍රතිපාදන ඌන උපයෝජනයක් සිදු වී ඇත. ප්‍රතිපාදන ඌන උපයෝජනය වී ඇති වැය විෂයයන් වල 2024 වර්ෂය සඳහා වෙන්කර තිබූ වාර්ෂික ප්‍රතිපාදන වලින් වර්ෂය තුළ වියදම් දැරීමට කටයුතු කරන ලද නමුත් භාණ්ඩාගාරය විසින් දෙන ලද උපදෙස් අනුව කටයුතු කිරීමට සිදුවීම මත වියදම් පාලනය කිරීම හා කළමනාකරණය කිරීම, වර්ෂය තුළ වරින් වර කාර්ය මණ්ඩලය	ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කළ යුතු අතර ලද ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට සැලසුම් ගතව කටයුතු කළ යුතුය.

පුරප්පාඩුව පැවතීම, විශාල පරිමාණයේ අළුත්වැඩියා ඇති නොවීම, වර්ෂය තුළ විදේශ විනිමය අනුපාතිකයේ උච්චාවචනයන් හේතුවෙන් ශ්‍රී ලංකා රුපියලේ අගය සැලකිය යුතු ලෙස ඉහළ යාම යන කරුණු නිසා අපේක්ෂිත වියදම් ඇති නොවීම ද හේතු වී ඇත.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය		ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i)	මුදල් රෙගුලාසි 187	දෛනික ලැබීම් දිනපතා හෝ හැකිතාක් අප්‍රමාදව බැංකුගත කළයුතු වුවද කුවේට් විදේශ දූත මණ්ඩලය 2024 අප්‍රේල් සහ මැයි මාසවල දෛනික ලැබීම් බැංකුගත කිරීමේදී දින 04 සිට දින 22 දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.	දූත මණ්ඩලයේ ප්‍රදූත සහකාර නිලධාරිනිය ප්‍රසූත නිවාඩු ලබා සිටීමෙන් කිහිප දෙනෙක් විසින් ඉටු කරනු ලබන රාජකාරි කටයුතු ගිණුම් නිලධාරි වෙත පැවරීම නිසාවෙන් දෛනික ලැබීම් බැංකු ගත කිරීම ප්‍රමාද වී ඇත. එම කාලසීමාව අවසන් වීමෙන් පසු මෙවැනි තත්ත්වයක් ඇති වී නොමැත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව දෛනික ලැබීම් අප්‍රමාදව බැංකුගත කළ යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 880	ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු නිලධාරින්ගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගෙන කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගේ ඇප අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතුය.

(ආ)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය 1.3.1 හා 1.3.6 වගන්ති	සෑම වාහනයක්ම වර්ෂ 5 කට වරක් තක්සේරු කර වටිනාකම ගිණුම්ගත කළ යුතු වුවත්, 2023 ඔක්තෝබර් 24 දින වාහන 72 ක් සඳහා තක්සේරු වාර්තාව ලබා ගෙන තිබුණද ඉන් වාහන 62 ක් මූල්‍ය ප්‍රකාශන තුළ නව තක්සේරු වටිනාකම් වෙනුවට මිලදී ගැනුම් වටිනාකම දක්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන තුළ මිලදී ගැනුම් වටිනාකම් ඇතුලත් කර ඇති වාහන 62 සම්බන්ධයෙන් නව තක්සේරු වටිනාකම් ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.	තක්සේරු වටිනාකම් මත වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	1985 සැප්තැම්බර් 10 දිනැති අමාත්‍යාංශ උපදෙස් මාලා අංක 101 න් සංශෝධිත 1971 මාර්තු 31 දිනැති අංක X – 365 දරන අමාත්‍යාංශ චක්‍රලේඛය උපදෙස් මාලා අංක 2 (b) ii	සමහර හදිසි වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍යතාවලදී දූතමණ්ඩලය පිහිටි රටේ ඒ සඳහා අවශ්‍ය වෛද්‍ය පහසුකම් නොමැති නම් ඒ බවට අනුමත වෛද්‍යවරයෙකු හෝ රෝහලකින් වෛද්‍ය පහසුකම් පවතින ලඟම රට ද සඳහන් කර වෛද්‍ය සහතිකයක් සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. අදාළ පරිදි ක්‍රියා නොකර ඔස්ට්‍රියාවේ වියානා හි ශ්‍රී ලංකා දූත මණ්ඩලයේ නිලධාරිනියකුගේ ශල්‍ය කර්මයක් ඇමෙරිකා එක්සත් ජනපදයේ රෝහලක දී 2019 අගෝස්තු 28 දින සිදු කිරීම වෙනුවෙන් ඔස්ට්‍රියාවේ වියානා තානාපති කාර්යාලය මඟින් රු.11,963,560 (USD 66,285) ක වෛද්‍ය බිල්පත් ගෙවීම හා රු.630,500 (EURO 3152) ක ගුවන් ගමන් ටිකට්පත් වියදම් ප්‍රතිපූර්ණය කිරීම සිදුකර තිබුණි.	පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ.	අදාළ ශල්‍යකර්ම පහසුකම ඔස්ට්‍රියාවේ නොමැතිද යන්න පිළිබඳ පරීක්ෂණයක් සිදු කර මීට අදාළව අක්‍රමිකතාවයක් සිදු වී ඇත්නම් වරදකරුවන්ගෙන් පාඩුව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. ඉදිරියේදී වෛද්‍ය ප්‍රතිකාර හදිසි අවශ්‍යතාවයක් වන විට නිළධාරියා සේවය කරන දූතමණ්ඩලය පිහිටි රටේ අවශ්‍ය වෛද්‍ය පහසුකම් නොමැති බවට වෛද්‍යවරයෙකු හෝ රෝහලකින් ලබා ගත් වෛද්‍ය සහතිකයක් සමග ඉල්ලීම ඉදිරිපත් කර තිබිය යුතුය.
(ඈ)	2023 පෙබරවාරි 22 දිනැති ජනාධිපති ලේකම්ගේ අංක පීඑස්/සීඑස්ඒ/ච	චක්‍රලේඛයේ දක්වා ඇති රජයේ නිලධාරීන් හැර අනෙකුත් සියළුම රජයේ නිලධාරීන් පිරිමැසුම් පංතියේ ගුවන් ටිකට්පත් මිලදීගත යුතු අතර ව්‍යාපාරික පංතියේ ගමන් කිරීමට අවශ්‍ය නම්	පිළිතුරු ඉදිරිපත් කර නැත.	පූර්ව අනුමැතිය ලබා ගෙන නොමැති බැවින් වැඩිපුර වැය වූ මුදල අදාළ නිලධාරිනියගෙන් අය කර ගැනීමට

ක්‍රලේඛ/4/ 2023 දරන චක්‍රලේඛය	ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර පූර්ව අනුමැතිය ලබාගත යුතුය. ඒ අනුව කටයුතු නොකර හිටපු අමාත්‍යාංශ ලේකම්වරියක් රාජකාරි විදේශ සංචාරයන් 02 ක් සඳහා ව්‍යාපාරික පංතියේ ගමන් කිරීම වෙනුවෙන් රු.4,091,700ක් වැයකර තිබුණු අතර ඒ සඳහා වැඩිපුර වැය වූ රු.2,165,272 ක මුදල අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.		කටයුතු කළ යුතුය.

3.4. තැන්පතු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීමට තාවකාලිකව රඳවාගන්නා තැන්පතු තුළ වසර දෙකකට වැඩි කාලයක සිට පවතින එකතුව රු.30,197,131 ක් නිරවුල් කර නොතිබුණි.	කොවිඩ් වසංගත සමයේදී ශ්‍රී ලාංකිකයින් මෙරටට පැමිණ නිරෝධායනය වීම සඳහා මුදල් තැන්පත් කර ඇත. ඇතැම් පුද්ගලයන්ගේ නිරෝධායන කාල සීමාව දින 14කට වඩා අඩු වූ නිසා ඉතිරි වූ මුදල් හිමිකරුවන් වෙත නැවත ගෙවීමට ඔවුන් සම්බන්ධ කර ගැනීමේ දුෂ්කරතා පවතින නිසා අදාළ මුදල් ගෙවීම් කටයුතු ප්‍රමාද වී ඇත.	තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගත් තැන්පතු නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.5 බැංකු ගිණුම් මෙහෙයවීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බර්ලින් විදේශ දූත මණ්ඩලයෙහි බැංකු ගිණුමට තැන්පත් කර මාස 08 සිට මාස 22 දක්වා කාලයක් ගත වූ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 02 කට අදාල යූරෝ 239 ක එකතු වටිනාකමක් ද ලන්ඩන් විදේශ දූත මණ්ඩලයෙහි බැංකු ගිණුමට තැන්පත් කර මාස 02 සිට මාස 22 දක්වා කාලයක් ගත වූ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 17කට අදාළ ස්ටර්ලින් පවුම් 2,179 ක එකතු වටිනාකමක් ද පැවතුණි.	උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස දූත මණ්ඩල වෙත උපදෙස් ලබා දී ඇත.	උපලබ්ධි නොවූ තැන්පතු හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	සිංගප්පූරුව විදේශ දූත මණ්ඩලයෙහි අවස්ථා 01ක දී සිංගප්පූරු ඩොලර් 50 ක ද, බර්ලින් විදේශ දූත මණ්ඩලයෙහි අවස්ථා 02ක දී යූරෝ 1,780 ක ද, පැරිස් විදේශ දූත මණ්ඩලයෙහි අවස්ථා 05ක දී යූරෝ 3,742 ක ද එකතු වටිනාකම් බැංකු ගිණුම් වෙත සෘජුව හර වී තිබුණු අතර ඒවා හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.	විදේශ දූත මණ්ඩලයේ බැංකු ගිණුම් වෙත සෘජු ව හර වී ඇති මුදල් ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.	බැංකු ගිණුම් වෙත සෘජුව හර වී ඇති මුදල් නොපමාව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය.
(ඇ)	පැරිස් විදේශ දූත මණ්ඩලයෙහි අවස්ථා 55 ක දී යූරෝ 4,099 ක ද රෝමය විදේශ දූත මණ්ඩලයෙහි අවස්ථා 35 ක දී යූරෝ 2,690 ක ද බීජිං විදේශ දූත මණ්ඩලයෙහි අවස්ථා 13 ක දී යුවාන් 3,019 ක හා අවස්ථා 13 ක දී ඇමරිකන් ඩොලර් 823 ක ද වර්සෝ විදේශ දූත මණ්ඩලයෙහි අවස්ථා 02 ක දී පෝලන්ත ස්ලෝටි 547 ක ද කැන්බරා විදේශ දූත මණ්ඩලයෙහි අවස්ථා 54 ක දී ඕස්ට්‍රේලියානු ඩොලර් 10,353 ක ද කරච්චි විදේශ දූත මණ්ඩලයෙහි අවස්ථා 01 ක දී පකිස්ථානු රුපියල් 7,000ක ද සෝල් විදේශ දූත මණ්ඩලයෙහි අවස්ථා 14 ක දී කොරියානු වොන් 2,660,000 ක ද එකතු වටිනාකම් බැංකු ගිණුම් වෙත සෘජුව බැර වී තිබුණු නමුත් ඒවා හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.	ඉදිරියේ දී එකී මුදල් හැකි ඉක්මණින් නිරවුල් කිරීමට කටයුතු සිදු කරන ලෙසට උපදෙස් ලබා දී ඇත.	බැංකුව වෙත සෘජුව බැර වී ඇති මුදල් හඳුනාගෙන නොපමාව ගිණුම් ගත කළ යුතුය.
(ඇ)	2022 සැප්තැම්බර් 21 දිනැති අයවැය චක්‍රලේඛ අංක 06/2022 හි සඳහන් පරිදි අහෝසි වී ගිය වැය ශීර්ෂවලට අදාළ අක්‍රීය නිළ බැංකු ගිණුම් වසා දැමිය යුතු වේ. එසේ වුවද, වසා දමන ලද විදේශ දූත මණ්ඩල 04 ක අක්‍රිය බැංකු ගිණුම් 06 ක පැවති මුදල් පොත අනුව බැංකු ගිණුම් 03 ක ඇමෙරිකානු ඩොලර් 46,859,350 ක් ද, එක් බැංකු ගිණුමක ඉරාන රියාල් 144,343,540 ක් ද, එක් බැංකු ගිණුමක නයිජීරියානු	දූත මණ්ඩල වෙතින් බැංකු සැසඳුම් ප්‍රකාශ ලැබුණු වහාම එම ගිණුම වසා දැමීමට කටයුතු කරනු ලැබේ. ටෙහෙරාන් හි නීතිමය කටයුත්තක් සිදුවන බැවින් ඒ සම්බන්ධයෙන් සොයා බලා නිසි ක්‍රියාමාර්ග ගන්නා මෙන් අදාල බලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	අක්‍රිය බැංකු ගිණුම් විධිමත් පරිදි වසාදැමීමට කටයුතු කළ යුතුය.

	නයිරා 21,917,023 ක් ද අනෙක් බැංකු ගිණුමෙහි ඕස්ට්‍රේලියානු ඩොලර් 906 ක් ද වශයෙන් මුදල් ශේෂ පැවැතුණු අතර අදාළ ගිණුම් වසා දමා නොතිබුණි.		
(ඉ)	ලන්ඩන් විදේශ දූත මණ්ඩලයේ අංක 0088000221 දරන බැංකු ගිණුමට අදාළව 2024 දෙසැම්බර් මාසය සඳහා සකස් කර තිබූ බැංකු සැසඳුම තුළ ස්ටර්ලින් පවුම් 9,611.39 ක හඳුනා නොගත් හර වටිනාකමක් පැවතුණි.	ස්ටර්ලින් පවුම් 4310 ක මුදලක් ඉදිරියේ දී පොතෙන් කපා හැරීමටත්, ඉතිරිය මැයි මස ගිණුම් සාරාංශයෙන් නිවැරදි කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.	හඳුනා නොගත් හර ශේෂ හඳුනාගෙන නොපමාව නිරවුල් කිරීම් සිදු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටුනොකිරීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විදේශ රටවලදී සිදු වූ අනතුරු හා මිය යෑම් වෙනුවෙන් වන්දි නොගෙවන ලද සිද්ධීන්ට අදාලව 2014 වර්ෂයට පෙර සිට පැවත එන ලිපිගොනු 340 ක් හා 2015 සිට 2023 කාලපරිච්ඡේදයට අදාල ලිපිගොනු 1435 ක් වැඩ අවසන් නොකළ වන්දි ලිපිගොනු ලෙස කොන්සියුලර් අංශයේ පැවතුණි.	මෙම වන්දි ගොනු වලින් වැඩි ප්‍රමාණයක් නීතිමය කටයුතු අවසන් නොවීම මත ක්‍රියාකාරීව පවතින ගොනු වේ. ප්‍රමාදයන් පවතින ගොනු සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	ප්‍රමාදයක් පවතින වැඩ අවසන් නැති වන්දි ලිපිගොනු පිළිබඳව නිරතුරුව අවධානය යොමුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	කටාර් රාජ්‍යයෙහි සේවා නියුක්තිය සඳහා විදේශ ගත වූ තැනැත්තෙකු හදිසි අනතුරකින් 2012 සැප්තැම්බර් 10 වන දින මිය ගොස් තිබුණු අතර කොන්සියුලර් අංශය මෙම සිද්ධියට අදාළ වන්දි ඉල්ලීම් තොරතුරු 2013 පෙබරවාරි 06 දින තානාපති කාර්යාලයට දන්වා තිබුණි. එමෙන්ම මියගිය පුද්ගලයා වන්දි සඳහා සුදුසුකම් ලබා ඇති බව තහවුරු කර ඇති බවත් අදාළ වන්දි මුදල් හැකි ඉක්මණින් ප්‍රේෂණය කරන බවත් 2024 ජූනි 09 දින තානාපති කාර්යාලය මඟින් දන්වා එවා තිබුණද වසර 12 කට වඩා පැරණි මෙම වන්දි මුදල්	2012 සැප්තැම්බර් 10 වැනි දින හදිසි අනතුරකින් මිය ගොස් ඇති තැනැත්තා සඳහා වූ වන්දි මුදල සම්බන්ධව කටාර් හි පිහිටි අධිකරණය තුළ නඩු පවරා ඇත. මෙම නඩු විභාගය සම්බන්ධ ව කටාර් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් නඩුවට අදාළ වර්තමාන තත්ත්වය 2024 ජූනි 09 වැනි දින ලිපියක් මගින් මෙම අමාත්‍යාංශය දැනුවත් කර ඇත. ඒ අනුව, වයි.එම්.බසීර් මහතා වන්දි මුදල ලබා ගැනීම සම්බන්ධව සුදුසුකම් ලබා ඇති බැවින්, එම වන්දි මුදල ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත ලැබූ විගස දැනුවත් කිරීමට කටයුතු කරන බව කටාර් තානාපති කාර්යාලය විසින් දන්වා ඇත.	වන්දි ගෙවීම සම්බන්ධව රාජකාරී ඉටු කරන නිලධාරීන් තම රාජකාරී කටයුතු අප්‍රමාදව හා කාර්යක්ෂමව ඉටු කිරීමට මෙහෙය විය යුතුය.

	අදාළ පාර්ශවයන්ට ගෙවීම් කර නොතිබුණු අතර ප්‍රමාදය සඳහා ගත් ක්‍රියාමාර්ග ද තොරතුරු ගොනුවෙහි ඇතුළත් නොවුණි.		
(ඇ)	කටාර් රාජ්‍යයෙහි සේවා නියුක්තිය සඳහා විදේශ ගත වූ තැනැත්තෙකු 2012 ඔක්තෝබර් 21 දින හදිසි අනතුරකින් මිය ගොස් තිබුණු අතර 2012 නොවැම්බර් 06 දින අදාළ වන්දි ඉල්ලීම සිදු කර තිබුණි. 2023 මැයි 10 වන දින මෙම සිද්ධිය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ පසු විපරම් ලිපිය සඳහා 2023 දෙසැම්බර් 04 වන දින තානාපති කාර්යාලයේ පිළිතුරු ලිපිය පරිදි නිසි කාලසීමාව තුල නඩු පැවැරීමට කටයුතු කර නොමැති බවත් මෙම නඩුව 2018 සැප්තැම්බර් 26 දින UNI CIAIMS QATAR Law Firms නැමැති නීති ආයතනය වෙත භාරදුන් බවටත් සඳහන් වන අතර නඩුව පැවරූ නීති ආයතනය හා නඩු පැවරීම පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර වන්දි ලබා ගැනීමට අප්‍රමාදව කටයුතු කර නොතිබුණි.	පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ.	වන්දි ගෙවීම සම්බන්ධව රාජකාරී ඉටු කරන නිලධාරීන් තම රාජකාරී කටයුතු අප්‍රමාදව හා කාර්යක්ෂමව ඉටු කිරීමට මෙහෙය විය යුතුය.
(ඇ)	විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි වූ රැකියා ඒජන්සියක් හරහා 2011 වර්ෂයේ දී සවුදි අරාබි රාජ්‍යයේ රැකියාවක් සඳහා විදේශ ගත වූ තැනැත්තෙකු 2012 ඔක්තෝම්බර් 24 දින රිය අනතුරකින් පූර්ණ ආබාධිත තත්වයට පත් වී තිබුණි. 2016 සැප්තැම්බර් 28 දින වන්දි ඉල්ලීම් කර තිබුණු නමුත් 2025 මාර්තු 03 දින වන විටත් පොලිස් වාර්තාව ඉදිරිපත් නොකිරීම හේතුවෙන් වන්දි ගෙවීම් ප්‍රමාද වී ඇති අතර වසර 08 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද වන්දි ඉල්ලීම් සම්බන්ධ කටයුතු අවසන් කර නොතිබුණි.	සවුදි අරාබියේ අධිකරණය විසින් එරට පොලිස් දෙපාර්තමේන්තුව වෙත අනතුර සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් ලබා දෙන ලෙස නියෝග කර ඇති අතර ,එම වාර්තාව අධිකරණය වෙත ලැබීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බවට දැනුම් දී ඇත . පොලිස් දෙපාර්තමේන්තුවෙන් අදාළ වාර්තා ලැබීමට ප්‍රමාද වීම හේතුවෙන් තානාපති කාර්යාලය මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.	වන්දි ගෙවීම සම්බන්ධව රාජකාරී ඉටු කරන නිලධාරීන් තම රාජකාරී කටයුතු අප්‍රමාදව හා කාර්යක්ෂමව ඉටු කිරීමට මෙහෙය විය යුතුය.

(ඉ)	විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි වූ රැකියා ඒජන්සියක් හරහා 2009 දෙසැම්බර් 19 දින ගෘහ සේවිකාවක් ලෙස කුවේට් රාජ්‍යයේ රැකියාවක් සඳහා විදේශ ගත වූ අයෙකු 2012 ජනවාරි 29 දින සැක කටයුතු ආකාරයට මිය ගොස් තිබුණු අතර මිය ගොස් වර්ෂ 12 කට අධික කාලයක් ගත වුවද ඒ සඳහා වන්දි මුදලක් ලබා ගැනීමේ හැකියාවක් පවතීද යන්න පරීක්ෂා කර බලා කටයුතු කර නොතිබුණි.	ශ්‍රී ලංකාවේදී සිදු කරන ලද මරණ පරීක්ෂණය හා කුවේට් හි සිදු කර ඇති මරණ පරීක්ෂණය අතර වෙනස්කම් ඇති බැවින්, ඒ පිළිබඳව කුවේට් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙන් විමසීම් කර ඇත. ඒ අනුව තානාපති කාර්යාලයෙන් මෙම අමාත්‍යාංශය වෙත එවා ඇති කුවේට් හි අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයෙන් ලැබී ඇති වාර්තාවේ දැක්වෙන්නේ මෙම මරණය අසනීපයක් නිසා සිදු වූ බවයි.	වන්දි ගෙවීම සම්බන්ධව රාජකාරී ඉටු කරන නිලධාරීන් තම රාජකාරී කටයුතු අප්‍රමාදව හා කාර්යක්ෂමව ඉටු කිරීමට මෙහෙය විය යුතුය.
(ඊ)	2009, 2012 හා 2013 වර්ෂයන්හිදී කටාර් රාජ්‍යයෙහි සේවා නියුක්තියේ යෙදී සිටියදී, අනතුරු හේතුවෙන් මිය ගිය ශ්‍රී ලාංකිකයන් 06 දෙනෙකුගේ වන්දි ලබා ගැනීම් සම්බන්ධයෙන් නඩු පැවැරීම සඳහා තෝරා ගත් නීති ආයතන හා තානාපති කාර්යාලය අතර ලිපි හුවමාරු සම්බන්ධ තොරතුරු තානාපති කාර්යාලය සතුව නොතිබුණි. කටාර් තානාපති කාර්යාලයේ නිලධාරීන් නියමිත කාලයේ දී වන්දි ලබාගැනීමට විධිමත්ව කටයුතු නොකිරීම මත වන්දි හා දීමනා ලබාගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.	පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ.	වන්දි ගෙවීම සම්බන්ධව රාජකාරී ඉටු කරන නිලධාරීන් තම රාජකාරී කටයුතු අප්‍රමාදව හා කාර්යක්ෂමව ඉටු කිරීමට මෙහෙය විය යුතුය.

4.2 ප්‍රසම්පාදනයන්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 අප්‍රේල් 01 දිනැති අධ්‍යක්ෂ ජනරාල් (පාලන) ගේ අභ්‍යන්තර සංදේශය හා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන කටයුතු කිරීමකින් තොරව 2024 ජූලි මාසයේ අවස්ථා දෙකක දී විදේශ සංචාරයන් වෙනුවෙන් රු.6,855,350 ක වියදමක් දරා ගුවන් ටිකට්පත් මිලදීගෙන තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	ගුවන් ප්‍රවේශයන් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය.

4.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශය විසින් මිලදී ගෙන ඇති කොළඹ 08, ඇල්විටිගල මාවත, මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 17 ක් වෙනුවෙන් හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පත්ඉරු ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙතින් ලබා ගෙන මේ වනවිට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඇති අතර, සිහි කැඳවීම් ලිපි ද යවා ඇත.	දේපළවල හිමිකාරීත්වය අමාත්‍යාංශය වෙත නොපමාව පවරා ගත යුතුය.
(ආ)	නිශ්චිතව වාහනය හඳුනා ගැනීමට නොහැකි වන පරිදි විදේශ දූත මණ්ඩල වාහන කාණ්ඩය තුළ For CIGAS user ලෙස දැක්වෙන එකතු වටිනාකම රු.25,039,311 ක් වන වාහන 3 ක් ද වාහන අංකයක් සඳහන් නොවූ එකතු වටිනාකම රු.136,586,483 ක් වන වාහන 21 ක් ද පැවතුණි.	වාහන අංක නිවැරදිව හඳුනාගෙන මැයි මස **CIGAS** වැඩසටහනට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.	නොපමාව වාහන අංක හඳුනා ගතයුතු අතර වටිනාකම් නිසි පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	අමාත්‍යාංශය නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණු නමුත් අමාත්‍යාංශයේ භෞතිකව නොතිබුණු වාහන 20 ක් විය.	පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ.	අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති නමුත් භෞතිකව නොමැති වාහන හඳුනා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

4.4 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ විදේශ දූත මණ්ඩල දෙකක 2002 හා 2009 වර්ෂවලට අදාළ අයථා මුදල් පරිහරණය කිරීම් හා මුදල් තැන්පත් නොකිරීම් සම්බන්ධ සිද්ධීන් 2කට අදාළව රු.16,176,674 ක පාඩු දක්වා තිබුණි. මුදල් රෙගුලාසි 106 අනුව මුදල් ඌනතාවයක් හෝ අයථා පරිහරණයක් සිදු වූ විටක එම මුදල වහාම පූර්ණය කළ යුතු වුවත් ඉහත පාඩු අය කර ගැනීම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	මෙම සිදුවීම් 02 සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණයේ නඩු පවරා ඇති අතර එම නඩු කටයුතු අවසානයේ ලැබෙන තීන්දුව අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.	නොපමාව අභ්‍යන්තර පරීක්ෂණ කටයුතු සිදු කර අදාළ මුදල් හා අලාභයන් අය කිරීමට ක්‍රියා කළ යුතුය.

(ආ)	බදුකරු සමඟ ඇති කර ගත් කුලී ගිවිසුම අවසන් වීමට මාස 11 කට පෙර එනම්, 2024 මැයි 03 දින සිට කුලී පදනම මත ලබාගත් සෙලින්කෝ ගොඩනැගිල්ලේ 02 වන මහලේ පවත්වාගෙන ගිය කොන්සියුලර් අංශය සඳහා බත්තරමුල්ලේ සුහුරුපාය ගොඩනැගිල්ලේ 16 වන මහල කුලියට ලබා ගැනීමට අංක අමප/23/0149/626/002 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කර තිබුණි. ඒ අනුව, සෙලින්කෝ ගොඩනැගිල්ලේ 02 වන මහලේ බටහිර කුළුණේ කොන්සියුලර් අංශය පවත්වාගෙන ගිය වර්ග අඩි 1640 ක ප්‍රමාණය 2024 මැයි 03 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ කිසිදු කාර්යයක් සඳහා භාවිතා කිරීමකින් තොරව පැවති අතර එම කාලය සඳහා රු.2,820,800 ක නිෂ්කාර්ය කුලී වියදමක් දරා තිබුණි.	මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා විදේශ කටයුතු ලේකම්ගේ (හිටපු) අනුමැතිය යටතේ 2024 ජුනි 07 දින නිලධාරි කමිටුවක් පත් කරන ලදී. අංක අමප/24/1240/619/018 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමත වාණිජ දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය වෙතින් අනුයුක්ත කර ගැනීමට යෝජිත නිලධාරින් 2024 අවසන් වන තෙක් මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කිරීමක් සිදු නොවුණි. සෙලින්කෝ ගොඩනැගිල්ලෙහි 07, 09 සහ 10 වන මහල් ද පූර්ණ වශයෙන් උපයෝජනයට ලක්ව ඇති බැවින්, එම කොටස්වල වෙනත් අංශයන් ස්ථාපිත කිරීමේ හැකියාවක් ද නොතිබුණි.	රාජ්‍ය මුදල් වියදම් කිරීමේ දී සකසුරුවම් බව පවත්වා ගත යුතු අතර අනවශ්‍ය වියදම් හා පාඩුවීම් වළක්වා ගත යුතුය.

4.5 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කැන්බරා විදේශ දූත මණ්ඩලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව භාවිතයක් ලෙස 1999 වර්ෂයේ සිට නිලධාරීන්ගේ නිවාසවල විදුලිය, ජලය හා ගෑස් බිල්පත් වෙනුවෙන් ගෙවීම් සිදුකර ඉන් කොටසක් පමණක් නිලධාරීන්ගෙන් අයකරගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා නිලධාරීන් 13 දෙනෙකු වෙනුවෙන් රු.9,573,550 ක් ගෙවීම් කර තිබුණු අතර ඒ සඳහා නිලධාරීන්ගේ වැටුපෙන් රු.2,031,204 ක් පමණක් අයකරගෙන තිබුණි.	අදාළ තොරතුරු දූත මණ්ඩලය විසින් ඉල්ලා ඇති අතර තොරතුරු ලද පසු ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	අනුමැතිය නොලත් කිසිදු වියදමක් සිදු නොකළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයේදී කිසිදු ණය වාරිකයක් අය නොකළ විදේශ දූත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් 26 දෙනෙකුට අදාළ රු.1,101,824ක් ද, විවිධ හේතුන්මත සේවය අවසන් කල හා සේවය හැර ගිය නිලධාරීන් 17 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,286,042 ක් ද වූ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ණය ශේෂ හඳුනාගෙන අයකර ගැනීම සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතියි.	ණය ශේෂ නොපමාව අයකර කිරීමට කටයුතු කළ යුතුය.

5. **මානව සම්පත් කළමනාකරණය**

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අමාත්‍යාංශයේ ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරක් වන ශ්‍රී ලංකා විදේශ සේවයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 09 ක් අනුමත වී තිබුණු අතර ඒ සඳහා නිලධාරීන් 08 ක් ස්ථිර පදනමට පත් කර තිබුණු අතර තවත් නිලධාරීන් 07 දෙනෙකු වැඩ බැලීමේ පදනමට පත් කර තිබුණි. ඒ අනුව අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් 06 දෙනෙකු බඳවාගෙන තිබුණි. තවද, සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක් ද, තොරතුරු තාක්ෂණ සහකාර තනතුරක් ද, කාර්යාල කාර්ය සහායක තනතුරු 6 ක් ද වශයෙන් අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් 8 ක් බඳවාගෙන තිබුණි.	කාලීන අවශ්‍යතාවය මත අමාත්‍යාංශයීය අනුමත කාර්ය මණ්ඩලයට අදාලව එම තනතුරු සංඛ්‍යාව වැඩි කර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.	කාර්ය මණ්ඩල අවශ්‍යතාව කාලීනව සමාලෝචනය කර අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමටත් අනුමත කාර්ය මණ්ඩලය සඳහා බඳවාගැනීමටත් කටයුතු කළ යුතුය.